සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# මො/රාජකීය ජාතික පාසල
# Mo/ Rajakeeya National School

32 | S | I

## තෙවන වාර පරීක්ෂණය (2023) 2024 - 11 ශ්‍රේණිය
## Third Term Test (2023) 2024 Grade - 11

## ගණිතය - I
## Mathematics - I

කාලය : පැය 2
Time: 2 hours

**නම /විභාග අංකය**..............................................................

නිවැරදි බවට සහතික කරමි.

..............................................................

නිරීක්ෂකගේ අත්සන

**වැදගත් :**

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 8 කින් සමන්විත ය.
- **මෙම පිටුවේ ද, තුන්වැනි පිටුවේ ද** නියමිත ස්ථානවල ඔබේ **විභාග අංකය** නිවැරදි ව ලියන්න.
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු ලිවීමටත් එම පිළිතුර ලබා ගත් ආකාරය දැක්වීමටත් ඒ ඒ ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **අදාළ පියවර** හා **නිවැරදි ඒකක** දක්වන්න.
- පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ :

  **A කොටසෙහි** එක් එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින්
  **B කොටසෙහි** එක් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්
- කටුවැඩ සඳහා හිස් කඩදාසි භාවිතා කළ හැකි ය.

**පරීක්ෂක වරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| A | 1 - 25 | |
| B | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| එකතුව | | |
| පරීක්ෂකගේ අත්සන | | |

A කොටස

(ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න)

01. $\sqrt{46}$ සඳහා වඩාත්ම ගැලපෙන අගය කුමක්ද?

i. 6.3 ii. 6.7 iii. 6.8 iv. 6.9

02. $y^2 - 8y - 20$ සාධක දෙකක ගුණිතයක් ලෙස ලියන්න.

03. දී ඇති මිනුම් අනුව AC පාදයේ දිග සොයන්න.




04. $4x^2, 3xy, 8x^2y$, වීජීය පදවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න

05. සිලින්ඩරාකාර ලී කොටයක හරස්කඩ මුහුණතේ පරිධිය 88$cm$ කි. එහි වක්‍ර පෘෂ්ඨ වර්ගඵලය 1760$cm^2$ වේ. ලී කොටයේ උස සොයන්න.

06. $ABCD$ චතුරස්‍රයේ $A\hat{D}C = 100^0$කි. $AD = DC$වේ. $x$හි අගය සොයන්න.




07. $OAB$ කේන්ද්‍රික ඛණ්ඩයේ අරය $28cm$ක් වේ. පරිමිතිය සොයන්න.



08. $A = \begin{pmatrix}2 & -3\\4 & 0\end{pmatrix}$ $B = \begin{pmatrix}-2 & 1\\5 & 2\end{pmatrix}$ ද නම් $2A + B$ න්‍යාසය ලියන්න.

09. $\frac{1}{2x} + \frac{3}{8x}$ සුළු කරන්න.

10. $JKLM$ රොම්බසයේ $JL = 24cm, KM = 10cm, LM$ දිග සොයන්න.




11. රූපයේ දැක්වෙන ඒකාකාර හරස්කඩක් සහිත ප්‍රිස්මයේ සෘජු කෝණය අඩංගු පාද දෙක $6cm$ හා $8cm$ වේ. එහි දිග $6cm$ හා $10cm$ කි. ප්‍රිස්මයේ පරිමාව සොයන්න.




12. රූපයේ $ABC$ සමපාද ත්‍රිකෝණයකි. $AC = CD$ වේ. $B\hat{A}D$ හි අගය සොයන්න.




13. රූපයේ $A$ සිට $B$ හි දිගංශය $280^0$කි. $B$ සිට $A$ හි දිංගශය කීයද?



14. $AB$ සරල රේඛාවේ සමීකරණය කුමක්ද?




15. මිනිත්තුවට ලීටර් 25ක ඒකාකාර සීග්‍රතාවයකින් ජලය ගලා එන නලයකින් ලීටර් 3000ක ධාරිතාවයක් ඇති ටැංකියක් සම්පූර්ණයෙන් පුරවනු ලැබේ. ගතවන කාලය පැය කීයද?

16. $O$ කේන්ද්‍රික වෘත්තයේ $OX \perp AB$වේ. $OX = 4cm$ නම් $BC$ පාදයේ දිග සොයන්න.




17. මිනිසුන් 8 දෙනෙකුට දින 6 දී එක්තරා වැඩකින් හරි අඩක් නිම කල හැකිය. දින 3ට පසු දෙදෙනෙක් අසනීප වූ බැවින් වැඩට නොපැමිණියේය. ඉතිරි අය සම්පූර්ණ වැඩය නිම කරන ලදී. ඒ සඳහා ගතවූ මුළු දින ගණන සොයන්න.

18. රූපයේ දැක්වෙන වෘත්තයේ $AB$ විශ්කම්භයකි. $A\hat{D}C = 40^0$ නම් $x$ හි අගය සොයන්න.




19. $\varepsilon =${කාර්යාල සේවකයින්}

$A =$ {වයස අවුː 40ට වැඩි සේවකයින්}

$B =$ {ගැහැණු}

අඳුරු කල කොටස වචනයෙන් විස්තර කරන්න.



20. $ABCD$ වෘත්ත චතුරස්‍රයේ දික්කල $AD$ හා $BC$ $F$ හිදී හමුවේ. $AB \nearrow\nearrow CD, CF = DF$ හා $C\hat{F}D = 40^0$ කි. $A\hat{B}C$ අගය සොයන්න.




21. $log_3 81 = 4$ දර්ශක ආකාරයෙන් ලියන්න.

22. පසුම්බියක රු. 2/= කාසි තුනක් ද 10/= කාසි හතරක් ද ඇත. අහඹු ලෙස ගත් කාසියක් රුපියල් 2/= කාසියක් වීමේ සම්භාවිතාවය කීයද?

23. විදුලි උපකරණයක් රු. 12000ට විකිණිමෙන් වෙලෙන්දෙක් 20% ලාභ ලබයි. එය ගත් මිල කීයද?

24. පන්තියක ළමුන් පිරිසකගේ උස පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| උස $cm$ | 140 | 142 | 145 | 148 | 150 | 155 | 160 |
|---|---|---|---|---|---|---|---|
| ළමුන් ගණන | 4 | 6 | 12 | 10 | 8 | 6 | 3 |

ළමයකුගේ මධ්‍යස්ථ උස සොයන්න.

25. ඉඩමක මායිම් දෙකක් $PQ$ හා $QR$ මගින් එක්වේ. එම මායිම් දෙකට සමදුරින් හා $QR$ මායිමට $8m$ක් ඈතින් $C$ නම් පොල් ගසක් ඇත. පථ පිළිබඳ දැණුම භාවිතයෙන් $C$ හි පිහිටිම පහත දළ සටහනේ ලකුණු කරන්න.



*B* කොටස

01. මිනිසෙක් තමා සතු ඉඩමක් විකිණීමෙන් ලැබූ මුදලින් $\frac{1}{3}$ක් තමාට ද $\frac{1}{5}$ක් බිරිඳට ද වෙන් කරන ලදි. ඉතිරි මුදලින් $\frac{4}{7}$ක් පුතාට දුන්නේය. එවිට ඉතිරි වූ මුදල දියණියන් දෙදෙනා අතර සමසේ බෙදන ලදී.

i. තමාට හා බිරිඳට වෙන් කල මුදල මුළු මුදලින් කවර භාගයක් ද?

ii. පුතාට දුන් මුදල මුළු මුදලින් භාගයක් ලෙස ලියන්න.

iii. දියණියකට ලැබුණු මුදල රුපියල් 250,000.00ක් නම් එම ඉඩම විකුණු මිල කීයද?

02. රූපයේ දැක්වෙන්නේ $PQRT$ ත්‍රැපිසියම හැඩයකින් හා $TSR$ කේන්ද්‍රික ඛණ්ඩයකින් යුත් බිම් කොටසකි.

a. එහි $PQ = 15m, PT = 6m, QR = 10m$වේ.




i. කේන්ද්‍රික ඛණ්ඩයේ අරය කීයද?

ii. බිම් කොටසේ පරිමිතිය සොයන්න

iii. බිම් කොටසේ වර්ගඵලය සොයන්න.

b. කපිල මහතා තම නිවසේ සිට පා පැදියෙන් පන්සලට ගොස් එම මාර්ගයේම නිවසට පැමිණේ. එම චලිතයට අදාල දුර කාල ප්‍රස්ථාරය පහත දැක්වේ.

i. නිවසේ සිට පන්සලට ගිය වේගය.

ii. ඔහු පාපැදියෙන් ගිය මුළු දුර කොපමණද?

iii. පන්සලට ගිය මුල් වේගයෙන්ම ඔහු නිවසට ආපසු පැමිණියේ නම් ප්‍රස්ථාරය වෙනස් විය යුතු ආකාරය රූපයේ ඇද ඒ ඇසුරින් මුළු ගමනට ගත වූ කාලය සොයන්න.



03. රුපියල් 25,000.00ක් වටිනා විදුලි උපකරණයක්

a. ආනයනය කිරීමේ දී 60%ක තීරු බද්ධක් අයකරනු ලැබේ.

i. ගෙවිය යුතු බදු මුදල කීය ද?

ii. එය රුː 48,000.00 ට විකිණීමෙන් ඔහු ලබන ලාභය ප්‍රතිශතයක් ලෙස ලියන්න.

b. යසිදු රුපියල් 90,000.00ක් යොදා වාර්ෂික ලාභාංශ ලෙස කොටසට රුː12ක් ගෙවන සමාගමක එකක් රුː 20.00 බැගින් වූ කොටස් මිල දී ගනී.

i. එම ආයෝජනයෙන් යසිදුගේ වාර්ෂික ලාභාංශ ආදායම සොයන්න.

ii. ආදායම යෙදවූ මුදලේ ප්‍රතිශතයක් ලෙස ලියන්න.

04. a. ළමුන් පිරිසකගේ ස්කන්ධය මැන ලබාගත් තොරතුරු පහත දැක්වේ.

| ස්කන්ධය Kg | ළමුන් ගණන |
|---|---|
| 35 - 40 | 4 |
| 40 - 45 | - |
| 45 - 55 | - |
| 55 - 60 | 9 |
| 60 - 75 | 12 |

i. වගුවේ තොරතුරු අනුව අසම්පූර්ණ ජාල රේඛය සම්පූර්ණ කරන්න.




ii. වගුවේ හිස්තැන් පුරවන්න.

iii. ජාල රේඛය ඇසුරින් සංඛ්‍යාත බහු අස්‍රය අඳින්න.

b. පාසලේ උසස් පෙළ සඳහා අයදුම්කර ඇති බාහිර අයදුම් කරුවන් 120ක් ඔවුන් ඉල්ලුම් කළ විෂය ධාරාව පිළිබඳ තොරතුරු පහත වට ප්‍රස්තාරයේ දැක්වේ.




i. තාක්ෂණ වේදය තෝරාගත් සිසුන් ගණන කීය ද?

ii. ජීව විද්‍යාව තෝරාගත් සිසුන් ගණන 20කි. කළා හා වාණිජ තෝරාගත් පිරිස සමාන වේ. කළා විෂය ධාරාව තෝරාගත් සිසුන් දැක්වෙන කෙන්ද්‍ර කෝණය සොයන්න.

05. a. පෙරේරා මහත්මිය මිලදී ගත් මල් පැල 5න් 3ක් සුදු රෝස (W) වන අතර 2ක් රතු රෝස (R) වේ. ඒවා සිටුවීමට ගත් මල් පෝච්චි 3ක් සුදු පාට (W) වූ අතර ඉතිරි දෙක රතු (R) හා කොළ (G) පාට වේ.

i. එම පැල පෝච්චිවල සිටුවිය හැකි ආකාර සියල්ල පහත කාටිසීය තලයේ ලකුණු කරන්න.




ii. පෝච්චියේ පාටත් මල්වල පාටත් සමාන වීම වටකර දක්වා එහි සම්භාවිතාව සොයන්න.

b. පෙරේරා මහත්මිය මින් අහඹු ලෙස තෝරාගත් පැලයක් තම සහෝදරියට දුන්නාය එය ප්‍රරෝහනය වීම හෝ ප්‍රරෝහනය නොවීම සමසේ භාව්‍ය වේ.

iii. තොරතුරු පහත රුක් සටහනේ ඇතුලත් කරන්න




iii. ප්‍රරෝහණය වූ පැලයක අනිවාර්යෙන්ම මල් පිපේ, එහි රතුපාට මල් පිපිමේ සම්භාවිතාව සොයන්න.

PARCEL NO

# LOL.lk BookStore

## විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**